ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
(නාරා ආයතනය)
<u>තනතුරු පුරප්පාඩු</u>

ධීවර,ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය (නාරා ආයතනය) ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් පිළිබඳ විෂය සම්බන්ධයෙන් පර්යේෂණ සංවර්ධන හා කළමනාකරණ කටයුතු සිදුකරන හා සම්බන්ධීකරණය කිරීමේ වගකීම භාර ප්‍රධාන ජාතික ආයතනය වේ.
නාරා ආයතනයේ පුරප්පාඩු වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(පර්යේෂණ සහ සංවර්ධන) තනතුර සඳහා අදාල සුදුසුකම් හා පළපුරුද්ද සහිත පුද්ගලයින්ට අවස්ථාව විවර වේ.

බඳවා ගැනීමේ සුදුසුකම්

<u>බාහිර අයදුම්කරුවන් සඳහා</u>

පහත 01 හෝ 02

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජීව විද්‍යාව/ධීවර හා ජලජීවී විද්‍යාව/ජාන ඉංජිනේරු විද්‍යාව/සත්ව විද්‍යාව/උද්භිත විද්‍යාව/අණුක ජීව විද්‍යාව/ජෛව ඉංජිනේරු තාක්ෂණ විද්‍යාව/ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව/අලෙවිකරණය/සංඛ්‍යානය/රසායන විද්‍යාව/ආහාර විද්‍යාව හා තාක්ෂණය/ජීව රසායන විද්‍යාව/සමුද්‍රජීවී විද්‍යාව /ජෛව තාක්ෂණ විද්‍යාව/සාගර විද්‍යාව/භූ විද්‍යාව/භෞතික විද්‍යාව/ඛනිජ සම්පත් තාක්ෂණය/ධීවර හා සාගර විද්‍යාව/ධීවර තාක්ෂණය /පරිසර විද්‍යාව/කාර්මික හා පරිසර රසායන විද්‍යාව/පරිසර විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය/විල් විද්‍යාව හා ජල කළමනාකරණ විද්‍යාව/පරිසර හා වන සම්පත් කළමනාකරණය/ස්වාභාවික විද්‍යාව විෂය /මැනුම් විද්‍යාව/කෘෂි විද්‍යාව/ක්ෂුද්‍ර ජීව විද්‍යාව/පෘථිවි විද්‍යාව/මත්ස්‍ය ජීව විද්‍යාව හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

ඉහත විෂය ක්ෂෙත්‍රයකින් හෝ අදාල ක්ෂේත්‍රයකින් පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් ලබා තිබීම

. සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක , ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක “කළමනාකරණ මට්ටමේ” තනතුරුවල අවම වශයෙන් වසර 15 ක පළපුරුද්ද(අවම වශයෙන් මින් වසර 05 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.)

02 විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජීව විද්‍යාව/ධීවර හා ජලජීවී විද්‍යාව/ජාන ඉංජිනේරු විද්‍යාව/සත්ව විද්‍යාව/උද්භිත විද්‍යාව/අණුක ජීව විද්‍යාව/ජෛව ඉංජිනේරු තාක්ෂණ විද්‍යාව/ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව/අලෙවිකරණය/සංඛ්‍යානය/රසායන විද්‍යාව/ආහාර විද්‍යාව හා තාක්ෂණය/ජීව රසායන විද්‍යාව/සමුද්‍රජීවී විද්‍යාව /ජෛව තාක්ෂණ විද්‍යාව/සාගර විද්‍යාව/භූ විද්‍යාව/භෞතික විද්‍යාව/ඛනිජ සම්පත් තාක්ෂණය/ධීවර හා සාගර විද්‍යාව/ධීවර තාක්ෂණය /පරිසර

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

විද්‍යාව/කාර්මික හා පරිසර රසායන විද්‍යාව/පරිසර විද්‍යාව හා ස්වාභාවික සම්පත් කළමනාකරණය/විල් විද්‍යාව හා ජල කළමනාකරණ විද්‍යාව/පරිසර හා වන සම්පත් කළමනාකරණය/ස්වාභාවික විද්‍යාව විෂය /මැනුම් විද්‍යාව/කෘෂි විද්‍යාව/ක්ෂුද්‍ර ජීව විද්‍යාව/පෘථිවි විද්‍යාව/මත්ස්‍ය ජීව විද්‍යාව හෝ තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමඟ

ඉහත විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධිය ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක "ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ "අවම වශයෙන් වසර (05) ක විශිෂ්ඨ සේවා වාර්තාවක් හිමි නිලධාරියකු වශයෙන් පළපුරුද්ද ලබා තිබීම.

වැටුප් ක්‍රමය.

සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය

HM 2-1 - 1/2025: රු.161,140– 12x4850 =219,340/-

මීට අමතරව මෙම සේවා බාණ්ඩයට හිමි,රජය විසින් අනුමත අදාල වෙනත් දීමනා ද ගෙවනු ලැබේ.

(2027.01.01 දින තෙක් සිදු කෙරෙන බඳවා ගැනීම් හා උසස් කිරීම් සඳහා වැටුප් ගෙවීම් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 හි II උපලේඛනය පරිදි සිදු කරනු ලබයි.)

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

IV. ඉහත තනතුරු සඳහා තේරී පත්වන්නන් විසින් මාසික වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක කළ යුතු වන අතර, නියෝජිතායතනය විසින් ස්වකීය සම්පත්වලින් වැටුපෙන් 15% ක් අරමුදලට දායක කරනු ඇත.සේවක භාරකාර අරමුලට දායක වශයෙන් වැටුපෙන් 3 % ක් වන දායක මුදලක් නියෝජිතායතනය විසින් එම අරමුදලට දායක කරනු ඇත.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

අයදුම්කරන පිලිවෙළ

සියළුම අයදුම්කරුවන් ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ඔබගේ සම්පූර්ණ ජීව දත්ත පත්‍රිකාව, මූලික අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් සනාථකරන සහතික වල පිටපත් සහ උප්පැන්න සහතිකයේ පිටපතක් ද සමඟ **2026 ඔක්තෝම්බර් මස 19** වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **අධ්‍යක්ෂ ජනරාල්,ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය, කාක දූපත,මට්ටක්කුලිය, කොළඹ 15** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය.අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

නාරා ආයතනයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවන අතර,එම පරීක්ෂණයන්හි දී දක්වන කුසලතාව මත තනතුර සඳහා තෝරා ගැනේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදි ලකුණු ලබාදීම පහත පරිදිවේ.

අදාළ අතිරේක පළපුරුද්ද	- ලකුණු	30
අදාළ අතිරේක අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්	- ලකුණු	30
අනෙකුත් කාර්යය සාධනයන් හා කුසලතා	- ලකුණු	15
සම්මුඛ පරික්ෂණයේදී කාර්ය සාධනය	- ලකුණු	25
මුළු ලකුණු	-	100

රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල,සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානීන් මඟින් එවනු නොලබන, ප්‍රමාද වී ලැබෙන,අසම්පූර්ණ හෝ අපැහැදිලි අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය
කාක දූපත,
මට්ටක්කුලිය,කොළඹ - 15
011 – 2521000 / 2521006
(www.nara.ac.lk)

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED